
# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 10
- විෂයය - ඉතිහාසය
- පාඩම - 09 - පුනරුදය (2 කොටස )


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය


# පුනරුදය
## 2 කොටස




## ❑ විද්‍යාත්මක දියුණුව


❖ විශ්වය පිළිබඳ ඉදිරිපත් වූ නව මත

### 1.පෝලන්ත ජාතික නිකලස් කොපර්නිකස්




- මෙතුමා පෘථිවිය ගෝලාකාර බවත් පෘථිවිය ඇතුළු අනෙකුත් ග්‍රහයන් සූර්යයා වටා පරිභ්‍රමණය වන බවත් සොයාගත්තේය.
- ඔහු නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස හැදින්වේ.



## 2.ජර්මන් ජාතික ජොහැන්ස් කෙප්ලර්

- මෙතුමා සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටා <u>ඉලිප්සාකාරව</u> ගමන් ගන්නා බව සොයා ගත්තේය.






## 3.එංගලන්ත ජාතික අයිසෙක් නිව්ටන්

- ගුරුත්වාකර්ෂණ නියමය සොයාගත්තේය .



## 4.ඉතාලි ජාතික ගැලීලියෝ ගැලීලි

- මෙතුමා දුරදක්නය නිපදවූ අතර එයින් ආකාශ වස්තු නිරීක්ෂණය කළේය .
  (චන්ද්‍රයාගේ ආවාට,බ්‍රහස්පති ග්‍රහයාගේ උප ග්‍රහයන් )
- ඔහු අත්හදාබැලීමේ පියා ලෙස හැඳින්වේ.



## ❑ වෛද්‍ය විද්‍යාවේ දියුණුව

### 1.ඉංග්‍රීසි ජාතික විලියම් හාවේ

- රුධිර සංසරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය සොයා ගත්තේය.



## 2.ස්විස් ජාතික වෛද්‍ය පැරසල්සස්

- ලෙඩ රෝග සෑදීමට තුඩුදෙන හේතූද ඒවාට ප්‍රතිකර්මද අත්හදා බැලීය.



# 3.ස්විස් ජාතික මයිකල් සර්ටෙස්

- රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිටවී ගොස් පෙනහැලි මගින් පිරිසිදු වී යළිත් හදවතට පැමිණ ශරීරය පුරාම විසිරී යාම පිළිබඳ තොරතුරු සොයා ගත්තේය.



## ➢ දේශපාලනය නවෝදය

- මධ්‍යතන යුගයේදී ප්‍රාදේශීය පාලකයන් ලෙස කටයුතු කරන ලද්දේ ඉඩම් හිමි වංශාධිපතියන්ය
- මෙකල වංශාධිපතිවරු පාලන  කටයුතුවලදී  රජුට වඩා බලයක් භුක්ති වින්දහ
- එකල ජනතාවද රජුට වඩා ප්‍රාදේශීය පාලකයන්ට සමීප වූහ



# පුනරුද යුගය


## දේශපාලන නවෝදය

- පුනරුද සමයේ ජාතික රාජ්‍ය බිහි වීම දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත් ම වෙනසකි
- රජු පාලන කටයුතුවල දී වැදගත් වූ අතර සියලු බලතල රජු වටා කේන්ද්‍රගත විය
- වෙළෙඳ කටයුතුවල දියුණුවත් සමඟ මධ්‍යම පන්තියක් බිහි වීම සිදු විය
- රජවරු තමන්ගේ පාලන කටයුතුවල දී මෙම මධ්‍යම පන්තිකයන් සහාය කර ගත්හ

- **මධ්‍යම පාන්තිකයන් - වෙළෙන්දන් ,බැංකුකරුවන් ,නැව් හිමියන් ,තවලම් හිමියන්**

## ➢ ආර්ථික නවෝදය

- වැඩවසම් යුගයේ ප්‍රවේණි ක්‍රමය



# පුනරුද යුගය

## ආර්ථික නවෝදය


- ප්‍රවේණිය කේන්ද්‍ර කොට පැවති ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය පරිහානියට පත් වී වෙළෙඳාමේ දියුණුවක් ඇති විය
- වෙළෙඳ කටයුතු පුළුල් කිරීම සඳහා රජයේ අනුග්‍රහය සෘජුවම ලැබුණි
- නව මුහුදු මාර්ග ඔස්සේ යුරෝපා ජාතීන් පෙරදිගට හා ඇමරිකාවට පැමිනීම නිසා එම ප්‍රදේශවල තිබූ කුළු බඩු ,රන් රිදී, මුතු මැණික්, ඇතුන්, ඇත් දළ වැනි දේ යුරෝපයට ගෙන ගිය අතර මේ ඔස්සේ වෙළෙඳාමේ දියුණුවක් ඇති විය
- මුදල් භාවිතය වැඩි විය
- චෙක්පත් හා බැංකු අණකර ක්‍රමය පුනරුද සමයේ ආරම්භ විය

# නව වෙළෙඳ මාර්ග සොයා ගැනීම

- ක්‍රි.ව **1453** දී තුර්කිවරු විසින් කොන්ස්තන්තිනෝපල් නගරය යටත් කර ගැනීමෙන් පසු යුරෝපීයයන්ගේ වෙළඳ කටයුතුවලට බාධා ඇතිවිය.

- එනිසා පෙරදිගට ළඟාවිය හැකි නව මුහුදු මාර්ග සෙවීමට යුරෝපීයයන් පෙළඹුණහ .


➢ එය දේශගවේෂණ ව්‍යාපාරය නමින් හැඳින්වේ.



## ❑ දේශගවේෂණ ව්‍යාපාරය සාර්ථක වීමට බලපෑ හේතු

1. නාවික ගමන්වල සුරක්ෂිතව යෙදීමට හැකි මාලිමා යන්ත්‍රය, උතුරු තරු මාපකය නිපදවීම





## 2. පුනරුදයේදී ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම




## 3. ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම



## 4. ජාතික රාජ්‍යයන් නාවික ගමන් සඳහා අනුග්‍රහ දැක්වීම



➢ දේශ ගවේෂණය සඳහා මුලින්ම උනන්දු වූයේ පෘතුගාලය හා ස්පාඤ්ඤයයි.



❖ පෘතුගාලයේ නාවික හෙන්රි රජතුමා දේශ ගවේෂණ කටයුතු සඳහා අනුග්‍රහ දැක්විය





- පෘතුගීසි ජාතිකයෙකු වූ බර්තොලමියුඩයස් අප්‍රිකාවේ දකුණු කෙළවර දක්වා පැමිණි නමුත් එහිදී කුණාටුවකට හසුව
එය කුණාටු තුඩුව නමින් නම් කොට ආපසු ගියේය




- පෘතුගාලයේ රජු
එය සුභ පැතීමේ තුඩුව ලෙස
නම් කළේය

කුණාටු තුඩුව
(සුභ පැතීමේ තුඩුව )



- ඒ මහ ඔස්සේ පැමිණි වස්කෝද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට ළඟා විය





- ස්පාඤ්ඤයේ
  ෆර්ඩිනන්ඩ් රජු හා ඉසබෙලා රැජින
  දේශ ගවේෂණයට අනුග්‍රහ දැක්වූහ



එහි ප්‍රතිඵල ලෙස ,


- ක්‍රිස්ටෝපර් කොලම්බස් බටහිර ඉන්දීය දූපත් සොයා ගත්තේය





- ඇමරිගෝ වෙස්පුෂි ඇමරිකාව (නව ලෝකය) සොයා ගත්තේය





- ෆර්ඩිනන්ඩ් මැගලන් පිලිපීනය සොයා ගත්තේය






- කැබේ සහෝදරයෝ කැනඩාව සොයා ගත්හ



# පුනරුදයේ ගෝලීය ප්‍රවණතාව

- පුනරුදය මුලින් ම ආරම්භ වූයේ ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරයෙනි
- පසුව යුරෝපය පුරා පැතිරුණි
- දේශ ගවේෂණ නිසා යුරෝපීයෝ නව රටවල් සොයා යාමට පටන් ගැනීමේ ප්‍රතිඵලය වශයෙන් ආසියා, අප්‍රිකා හා ඇමරිකා මහද්වීපවල යුරෝපා බල ව්‍යාප්තියක් ඇති විය
- මේ නිසා දේශපාලන වශයෙන් මෙන්ම වෙළෙඳාම හා සමාජීය සංස්කෘතික වශයෙන් ද යුරෝපය හා සෙසු ලෝකය අතර සබඳතා ගොඩනැගුණි

# ➢ එහි ප්‍රතිඵල ලෙස ,

- මුද්‍රණ කර්මාන්තය ලොව පුරා පැතිරුණි
- යුරෝපා චින්තනය හා සාහිත්‍ය සෙසු රටවලත් ව්‍යාප්ත විය
- යටත් විජිතවල ධනවතුන්ගේ දූ දරුවන් අධ්‍යාපන කටයුතු සඳහා යුරෝපයට යාම
- යුරෝපීයයෝ යටත් විජිතවල තමන් ඇදහූ ආගම ප්‍රචාරය කිරීම
- යුරෝපයේ වාස්තු විද්‍යාව හා කලා ශිල්ප සෙසු රටවලටත් ව්‍යාප්ත විය
- යුරෝපීය තාක්ෂණය හා විද්‍යාත්මක දැනුම ලොව පුරා ව්‍යාප්ත විය

මෙමගින් පුනරුදය ගෝලීය ප්‍රවණතාවක් බවට පත් විය

# පුනරුදය ලංකාව කෙරෙහි බලපෑම



- පුනරුදයේ බලපෑම මෙරටට ලැබුණේ දිවයිනට පැමිණි පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයින් මඟිනි

- උඩරට ස්වාධීන රාජ්‍යයක් පැවති හෙයින් සමාජයේ පුළුල් වෙනසක් කිරීමට ඔවුන්ට නොලැබුණි

- 1815 දී උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත් වීමෙන් පසුව වර්ෂ 1948 දක්වා ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වශයෙන් පැවති හෙයින් එම කාලය තුළ මෙරට

  - දේශපාලන
  - ආර්ථික
  - සංස්කෘතික



වශයෙන් ද පුළුල් වෙනස්කම් රැසක් සිදු විය

## දේශපාලන වෙනස්කම්

- පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය
- ප්‍රදේශීය පාලන ක්‍රමය වෙනස් වීම
- නව නිලධාරීන් පන්තියක් බිහි වීම
- රෝම ලන්දේසි නීතිය
- අධිකරණ පද්ධතිය



## ආර්ථික වෙනස්කම්

- ලංකාව හා යුරෝපය අතර සෘජු වෙළෙඳ සබඳතා
- කුරුඳු, කෝපි, කොකෝවා, සිංකෝනා, තේ හා රබර් වැනි වෙළෙඳ බෝග
- වාණිජ ආර්ථික රටාව
- ආනයන අපනයන ආර්ථිකය
- මුදල් භාවිතය ප්‍රචලිත වීම
- දුම්රිය මාර්ග හා මහා මාර්ග පද්ධතිය
- වෙළෙඳ නගර බිහි වීම
- මධ්‍යම පන්තියක් බිහි වීම







## සමාජ සංස්කෘතික වෙනස්කම්

- පොත් පත්, සඟරා හා පුවත්පත් ආදිය ප්‍රකාශයට පත් වීම නිසා සමාජයේ දැනුවත් භාවය ඉහළ ගියේය
- ලාංකිකයන් යුරෝපා රටවලට ගොස් අධ්‍යාපනය ලබා මෙරටට පැමිණීමෙන් බටහිර චින්තනය මෙරටට ලැබුණි
- යුරෝපයේ පැවති ආගමික නිකායන් මෙරට පැතිරුණි
- බටහිර අධ්‍යාපන ක්‍රමය
- යුරෝපයේ පැවති වාස්තු විද්‍යාව





ස්තුතියි !